10 ශ්‍රේණිය.

පුරවැසි අධ්‍යාපනය. 2වන පාඩම Ms. Priyanka Jennet

---

10.2 බලය විමධ්‍යගත කිරිම හා බලය බෙදාහැරිම

බලය

බලය යනු, පාලන කටයුතු පවත්වා ගෙන යාමට රජයට ඇති හැකියාවයි. රාජ්‍යයක් සතු බලය **"ස්වාධිපති බලය"** වේ.

- බලයේ අවසාන හිමිකරුවා මහජනතාවයි.
- මහජනතාව සතු බලය **"පරමාධිපත්‍ය බලය"** වේ. (34පිටුව ශ්‍රී ලජකාවේ පරමාදිපත්‍ය බලය විස්තරවේ)
- පරමාධිපත්‍ය බලයට ඇතුලත් අංග 3කි. එනම්
  1. ඡන්ද බලය
  2. පාලන බලතල
  3. මුලික අයිතිවාසිකම්

බලයේ විවිධ ස්වරූප ( 34 පිටුව බලන්න)

- දේශපාලන බලය
- පරිපාලන බලය
- ආර්ථික බලය
- සමාජ බලය

බලයේ ප්‍රධාන අංග 2කි.

- **බලය විමධ්‍යගත කිරිම**
- **බලය බෙදාහැරිම.**

බලය විමධ්‍යගත කිරිම.

- බලය විමධ්‍යගත කිරිම යනු,මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල යම් ප්‍රමාණයක් ප්‍රදේශිය එකක වෙත පවරා දිමයි.
- පරිපාලන බලතල ප්‍රදේශිය මට්ටමෙන් පවරාදිම යනු, මධ්‍යම ආණ්ඩුව හා එහි ආයතන වල සිට සැලසුම් සම්පාදනය , කළමනාකරනය,සම්පත් සපයා ගැනිම හා බෙදාගැනිම පිළිබඳ වගකිම් ආණ්ඩුවේ කේන්ද්‍රිය ආයතන වලට , පරිපාලන ආයතන වලට පලාත් ආණ්ඩුවලට ,අර්ධ ස්වාධින අධිකාරි වලට හෝ සංස්ථා වලට බලතල පැවරිම.

❖ ශ්‍රී ලංකාවේ පරිපාලන බලතල විමධ්‍යගත කර ඇති ආකාර 2ක් දක්වන්න.

<u>**ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ සිට ප්‍රදේශිය මට්ටම දක්වා පරිපාලන බලතල විමධ්‍යගත කර ඇති ආකාරය.**</u>

ජාතික මට්ටම

|

දිස්ත්‍රික මට්ටම

|

ප්‍රදේශිය මට්ටම

|

ග්‍රමනිලධාරි කොට්ටාස මට්ටම

ඉහල නිදසුනට අනුව ශ්‍රී ලංකාවේ පරිපාලන බලතල නිල බල ක්‍රමය අනුව ජාතික මට්ටමේ සිට ප්‍රදේශිය මට්ටම හරහා විමධ්‍යගත කර ඇති ආකාරය පැහැදිලි වේ.

1. බලය විමධ්‍යගත කිර්මේ ආකාර 2ක් දක්වා ශ්‍රී ලංකාව ආසුරෙන් බලය විමධ්‍යගත කිරිමේ ක්‍රියාවලිය කෙටියෙන් පැහැදිලි කරන්න. (පිටු 35)
2. ශ්‍රී ලංකා රජය බලය විමධ්‍යගත කිරිමේ ස්භාවය කුමක්ද?

- ශ්‍රී ලංකාව ජාතික මට්ටමේ සිට ප්‍රදේශිය මට්ටම දක්වා පරිපාලන බලතල විමධ්‍යගත කිරිම.

උදා: ජාතික මට්ටම -> ආමාත්‍යංශ ලේකම්

|

දිස්ත්‍රික් මට්ටම ->. දිස්ත්‍රික් ලේකම්

|

ප්‍රදේශිය මට්ටම ->. ප්‍රදේශිය ලේකම්

|

ග්‍රාම නිලදාරි කොට්ටාසය -> ග්‍රාම නිලදාරි

- මධ්‍යම ආණ්ඩුවේ කාර්යයන් ප්‍රාදේශිය පාලන එකක වෙත පවරා දිම.

  උදා: පලාත් පාලන ආයතන

  මහ නගර සභා , නගර සභා , ප්‍රදේශිය සභා යන පලාත්

පාලන අායතන තුනට මධ්‍යම ආණ්ඩුවේ ප්‍රදේශිය කාර්යයන් විමධ්‍යගත කර ඇත.

3. රාජ්‍ය ව්‍යවසායකයන්ට හෝ අධිකරනයට අයත් බලතල ප්‍රදේශිය එකකයක් වෙත පවරා දිම.

උදා: දේපාර්තමේන්තු : අධ්‍යාපන දේපාර්තමේන්තුව

සෞඛ්‍ය දේපාර්තමේන්තුව

සංස්ථා. : ඛනිජ තෙල් නිතිගත සංස්ථාව

අධිකාරි. : ශ්‍රි ලංකා වරාය අධිකාරිය

මධ්‍යම පරිසර අධිකාරිය

මණ්ඩල. : විදුලිබල මණ්ඩලය

ජාතික ලොතරැයි මණ්ඩලය

සමාගම්. : ශ්‍රි ලංකා රක්ෂණ සමාගම

සෙවනගල සිනි සමාගම

- 2018 3වන වාර විභාගය

ශ්‍රිලංකාවේ පරිලන බල තල විමධ්‍යගත කර ඇති ආකාර 2ක් දක්වන්න

- 2015 3 වන වාර විභාගය

බලය විමධ්‍යගත කිරිමේ ආකාර 2ක් දක්වා ශ්‍රි ලංකාව ඇසුරෙන් බලය විමධ්‍යගත කිරිමේ ක්‍රියාවලිය කෙටියෙන් පැහරදිලි කරන්න. (පිටුව 35)රූල් 12ක් ඉඩ තබන්න..

<u>**රජ්‍යය**</u>

රජ්‍යයකට පැවරෙන කාර්යයන්

- නිතිය හා සාමය ආරක්ෂා කිරිම.
- පොදු සේවා පවත්වාගෙන යාම
- දිලිදුකම තුරන් කිරිම.
- සමාජ සුබසාදන සේවා සැපයිම

➢ සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම

රාජ්‍යයක ස්වරූප 2කි. මෙම ස්වරූප දෙකට අනුව බලය ක්‍රියාත්මක වන ආකාර විමසා බලමු.

- ❖ *ඒකීය රාජ්‍ය*
- ❖ *සන්ධීය රාජ්‍ය*

<u>ඒකීය රාජ්‍ය</u>

ඒකීය රාජ්‍යයක් යනු තනි මධ්‍යම ආණ්ඩුවක් යටතේ බලය ඒකරාශි වූ රාජ්‍යයකි.

උදා: ශ්‍රී ලංකාව, මහා බ්‍රිතාන්‍ය, ප්‍රංශය

**"සෑම ආකාරයකම අධිකාරී බලය එක් මධ්‍යම ආයතනයක් තුළ එකරාශි වී තිබේ නම් එය ඒකීය රජ්‍යක්‍රමයක් බව ."**

**- මහචාර්ය හර්මන් ජේ ෆයිනර් -**

ඒකීය රාජ්‍යයක ලක්ෂණ

- ❖ අණ්ඩුව සතු ව්‍යවස්ථාදායක,විධායක සහ අධිකරණ බලතල එක් මධ්‍යම ආණ්ඩුවකින් පමණක් ක්‍රියාවට නැංවීම.
- ❖ මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය විසින් සම්මත කරන පනත් මගින් පමණක් පරිපාලන බලතල විමධ්‍යගත කිරීම.

ඒකීය රාජ්‍යයක කිසිවිටක බලය බෙදාහැරීමක් සිදු නොවේ නමුත් මධ්‍යම ආණ්ඩුවේ ◌කාර්යයන් පහසු කර ගැනීම සඳහා සමහර පරිපාලන බලතල පමණක් ප්‍රාදේශීය ඒකක වෙත විමධ්‍යගතකර ඇත.

උදා: ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන

2016 3වන වාරය/2වන වාරය

- ඒකීය රාජ්‍යක ලක්ෂණ 3ක් ලියා ඉන් එකක් කෙටියෙන් දක්වන්න.
- එකීය ආණ්ඩුක්‍රමයක් පැවතීමේ වාසි 2ක් ලියා එකාක් කෙටියෙන් පහදන්න.

<u>සන්ධීය රාජ්‍ය</u>

මධ්‍යම ආණ්ඩු හා ප්‍රාන්ත ආණ්ඩු අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බලය බෙදා ඇති රාජ්‍යයන් වේ . මෙම රාජ්‍යයන් සන්ධීය හෙවත් ෆෙඩරල් ආණ්ඩුවේ.

උදා : ඇමරිකා එක්සත් ජනපදය,ස්විස්ටලන්තය

සන්ධිය රාජ්‍යක බල මධ්‍යස්ථාන 2කි

- ❖ **මධ්‍යම ආණ්ඩුව**
- ❖ **ප්‍රාන්ත ආණ්ඩුව**

• සන්ධිය රාජ්‍යයක බලය බෙදීම යනු,මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩු අතර ව්‍යවස්ථාදායක ,විධායකය , අධිකරනබලතල , ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රදේශිය පාලන ඒකක වෙනම පවරා දිම.

සන්ධිය රාජ්‍යයක ලක්ෂණ

- ❖ ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතිම.
- ❖ මධ්‍යම ආණ්ඩුවේ මෙන්ම ප්‍රාන්ත ආණ්ඩු සතු බලය බලතල පැහැදිලිව ආණ්ඩුක්‍රම  ව්‍යවස්ථාව තුල අන්තර්ගත විම.

සන්ධි රාජ්‍යයක සාර්ථක පැවැත්ම සඳහා තිබිය යුතු ගුණාංග

- ❖ රාජ්‍යයේ පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරිම.
- ❖ සියලු ජන කොටස් පොදු හැගිමෙන් යුතුව කටයුතු කිරිම.

සන්ධිය රාජ්‍යයන්හි නව ප්‍රවනතා

- ❖ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපනය කරන අවස්ථාවලදි මධ්‍යම ආණ්ඩුවට වාසි සහගත වන ලෙස එය සිදුකිරිම.
- ❖ රාජ්‍ය විසින් සපයන සුබසාධක කාර්ය ඉහල යාම තුලින් එහි වගකිම මධ්‍යම ආණ්ඩුවට පැවරිම.

- ➢ සන්ධිය රාජ්‍යයක මධ්‍යම ආණ්ඩුව මෙන්ම ප්‍රාන්ත ආණ්ඩු එක සමානව සලකුනු ලැබුවන් ක්‍රියාත්මක විමේදි මධ්‍යම ආණ්ඩුවට ප්‍රාන්තර ආණ්ඩු හැසිරවිමේ හැකියාව පවති කරුනු 3කින් ලියන්න.
  - ආණ්ඩුක්‍රම ව්‍යවස්තාව සංශෝදනය කිරිම සඳහා පමණක් ප්‍රන්ත ආණ්ඩුවල කැමැත්ත නොසලකා හැරිම
  - රාජ්‍ය විසින් සපයන සුබසාධක කාර්යය ඉහල යාම තුලින් එහි වගකිම මධ්‍යම ආණ්ඩුවට පැවරම
  -සන්නිවේදන හා ප්‍රවාහන සේවා තුල සිදුවි ඇති අති නවින දියුනුව නිසා සම්බන්දිකරනය වේගවත් විම..

**<u>සන්ධිය රාජ්‍යයක මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්තර ආණ්ඩු සතු බලතල</u>**

| මධ්‍යම ආණ්ඩුව | ප්‍රාන්ත ආණ්ඩුව |
|---|---|
| ජාතික ආරක්ෂාව | ප්‍රාන්තරයට අදාළ මැතිවරණ පැවැත්වීම |
| විදේශ කටයුතු | ප්‍රාන්තර අධිකරන කටයුතු |
| ත්‍රිවිධ හමුදාව මෙහෙයවීම | යටිතල පහසුකම් |
| මූල්‍ය පාලනය | මහජන උපයෝගිතා සේවා |

02 ඒකිය හා සන්ධිය ආණ්ඩුවල ලක්ෂණ 2ක බැගින් ලියන්න.( පිටු 36/38 බලන්න)

- ඒකිය ආණ්ඩුව
  - නිතිය පැනවීම සම්බන්ධයෙන් උත්තරිතර වන්නේ මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකයයි.
  - රාජ්‍යයේ ස්වාධිපති බලය එක් බල මධ්‍යස්ථානයක් වෙත ඒකරාශි වි පැවතිම.
- සන්ධිය ආණ්ඩු
  - ප්‍රජාතන්ත්‍රවාදි පාලන රාමුව ශක්තිමත් විම.
  - භූමි ප්‍රමාණය විශාල රාජ්‍යවල පරිපාලන තින්දු ගැනිමට පහසු විම.

රාජ්‍යයේ බල අධිකාරිය මධ්‍යම ආණ්ඩුව හා ප්‍රන්ත ආණ්ඩුව අතර බෙදි තිබිම (ප්‍රධානම ලක්ෂණයයි)

- තමන්ගේ බල ක්ෂේත්‍රය තුළ ස්වාධිනව ක්‍රියාත්මක විමට හැකියාව ඇතිනමුත් සමහර කරුනු සම්බන්දයෙන් එක්සත්ව ක්‍රියාත්මක විම.

# පුරවැසි අධ්‍යාපනය

# 10 ශ්‍රේණිය

## 2 බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදා හැරීම

*ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය ක්‍රමයක බලය යනු එම රාජ්‍යයේ පාලන කටයුතු පවත්වාගෙන යාම සඳහා එයට ඇති හැකියාවයි.
*ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක බලයෙ අවසාන හිමිකරුවා ජනතාව වන අතර එම ජනතාව සතු එම බලය පරමාධිපත්‍ය බලය නම් වේ.
*බලයේ විවිධ ස්වරූප ලෙස දේශපාලන බලය, පරිපාලන බලය, සමාජ බලය ,ආර්ථික බලය හැඳින්විය හැක.
* දේශපාලන විද්‍යාත්මක දෘෂ්ටි කෝණයට අනුව බලය යනු "බලය හසුරුවන අය තමන්ට කැමති ආකාරයට බලයට යටත්වන අය පාලනය කිරීමට ඇති හැකියාව සහ තම කැමැත්තට අවනත නොවන විට බල කිරීම මගින් අවනත භාවය ලබාගැනීමට ඇති හැකියාවයි."
* ආර්ථික විද්‍යාත්මක දෘෂ්ටිකෝණයට අනුව "බලය යනු ර්ථිකයක් තුල ආධිපත්‍යධාරී පිරිසක් විසින් අනෙකුත් අය මෙහෙයවීමට ගන්නා උත්සාහයයි."
*සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයට අනුව "බලය යනු සමාජය තුළ ජීවත්වන පුද්ගලයන් සහ පවතින සමාජ සංවිධාන අභිබවා කටයුතු කිරීමට සමාජයට ඇති හැකියාවයි."

## බලය විමධ්‍යගත කිරීම

* බලය විමධ්‍යගත කිරීම යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල යම් ප්‍රමාණයක් ප්‍රාදේශීය පාලනය ඒකක වෙත පවරාදීම වේ.
නැතිනම්
*මධ්‍යම ආණ්ඩුව සතු වන බලතල පරිපාලන කටයුතු පහසු කරගැනීම සඳහා සහ ප්‍රාදේශීය වශයෙන් පුද්ගලයන් පාලන කටයුතු වලට හභාගී කරවා ගැනීම සඳහා ප්‍රාදේශීය ඒකක වෙත පවරා දීම වේ.
* බලය විමධ්‍යගත කිරීමේ විශේෂ ලක්ෂණය වන්නේ;

මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය විසින් සම්මත කරනු ලබන පනතක් මගින් ඒ සිදු කරනු ලැබීමයි .එසේම මෙම බලතල නැවත ඕනෑම අවස්ථාවක මධ්‍යම ආණ්ඩුව වෙත පවරා ගත හැකි වීමයි. නිදසුන් ලෙස ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වෙත බලය විමධ්‍යගත කිරීමේ ක්‍රියාවලිය.
*බලය විමධ්‍යගත කිරීම තුළින් මධ්‍යම ආණ්ඩුව සහ එහි විවිධ ආයතනවල සිට සැලසුම් සම්පාදනය කිරීම , කළමනාකරණය සම්පත් සපයා ගැනීම, බෙදාහැරීම පිළිබඳ වගකීම ප්‍රදේශීය පරිපාලන ඒකක වෙත පවරා දෙයි.
* ශ්‍රී ලංකාවේ පරිපාලන රටාව විමධ්‍ය කර ඇති ආකාරය නිදසුන් ලෙස නගර සභා, මහ නගර සභා ,ප්‍රාදේශීය සභා දැක්විය හැකිය.

## -ඒකීය රාජ්‍යය-

*රාජ්‍ය සතු ව්‍යවස්ථාදායක විධායක සහ අධිකරණ යන බල තල එක් මධ්‍යම ආණ්ඩුවක් සතු වන සහ ක්‍රියාත්මක කරන රාජ්‍යය ඒකීය රාජය නම් වේ.
*කිසිදු ආකාරයක බල බෙදීමක් නොවේ.
* නමුත් පරිපාලන කටයුතු පහසු කර ගැනීමේ අරමුණින් මධ්‍යම ආණ්ඩුවේ සමහර පරිපාලන බලතල පමණක් මධ්‍යගත කරයි.

"සෑම ආකාරයකම අධිකාරී බලය එක් මධ්‍යම ආයතනයක් තුළ ඒකරාශි වී තිබේ නම් එය ඒකීය රාජ්‍යයකි."
-මහාචාර්ය හර්මන් ජෙ. ෆයිනර් -

## ඒකීය රාජ්‍යක ලක්ෂණ.

*ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක විධායක සහ අධිකරණ බලතල එක් මධ්‍යම ආණ්ඩුවකින් පමණක් ක්‍රියාවට නැංවීම.
* මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන කටයුතු පහසු කර ගැනීමේ අරමුණු සහිතව එකී පරිපාලන බලතල පමණක් ප්‍රාදේශීය පාලන ඒකක වෙත විමධ්‍යගත කර තිබීම.
*මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය විසින් සම්මත කරන පනතක් මඟින් පමණක් පරිපාලන බලතල විමධ්‍යගත කිරීම.
*මධ්‍යම ආණ්ඩුවට අවශ්‍ය ඕනෑම අවස්ථාවක විමධ්‍යගත කරන ලද එම පරිපාලන බලතල නැවත පවරා ගත හැකි වීම.

## ඒකීය ආණ්ඩු.

*ඒකීය රාජ්‍යය තුළ ක්‍රියාත්මක වන ආණ්ඩු ඒකීය ආණ්ඩු ක්‍රම ලෙස හඳුන්වයි.

"සෑම ආකාරයකම අධිකාරී බලය එක් මධ්‍යම බල ආයතනයක් තුළ ඒකරාශී වී තිබේ නම් එය

ඒකීය ආණ්ඩු ක්‍රමයක් වේ ." -මහාචාර්ය හර්මන් ජෙ. ෆයිනර්-.

ඒකීය ආණ්ඩු ක්‍රම පවතින රාජ්‍යයන්

ශ්‍රී ලංකාව මහා බ්‍රිතාන්‍ය ප්‍රංශය

## ඒකීය ආණ්ඩු ක්‍රමයක ලක්ෂණ

*මේ පිළිබඳව දේශපාලන විද්‍යාඥයන් විසින් ඉදිරිපත් කර ඇති මත වාද දෙකකි.
-මහාචාර්ය ඒ .වී .ඩයිසි-
"එක් මධ්‍යම බල ආයතනයක් පමණක් නීති පැනවීම පිළිබඳ උත්තරීතර බලය ඉසිලීම ඒකීය ආණ්ඩු ක්‍රමයක මූලිකම ලක්ෂණය වේ.".
- මහාචාර්ය සී . එෆ්.ස්ටොන්ග්-
"මධ්‍යම ආණ්ඩුවේ උත්තරීතරභාවය හා අතිරේක ස්වාධීපති ආයතන ආණ්ඩුක්‍රමය තුළ නොමැතිවීම ඒකීය ආණ්ඩු ක්‍රමයක දැකිය හැකි ප්‍රධාන ලක්ෂණය වේ."

## ඒ අනුව ඒකීය ආණ්ඩු ක්‍රමයක ලක්ෂණ ලෙස;

*නීති පැනවීම සම්බන්ධයෙන් උත්තරීතර වන්නේ ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය හෙවත් පාර්ලිමේන්තුව වීම.
*පරිපාලන කටයුතු පහසු කර ගැනීම සඳහා පළාත් ආයතන පළාත් පාලන ආයතන දක්වා බලය විමධ්‍යගත කිරීම සිදු කිරීම. උදාහරණ ලෙස ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන මහ නගර සභා, නගර සභා, සහ ප්‍රාදේශීය සභා
*රාජ්‍යයේ ස්වාධිපති බලය එක් බල මධ්‍යස්ථානයක් වෙත ඒකරාශී වී පැවතීම.
*ව්‍යවස්ථාදායක විධායක සහ අධිකරණ යන ත්‍රිවිධ බලතල මධ්‍යම ආණ්ඩුව වෙත කේන්ද්‍රගතව පැවතීම.

## ඒකීය ආණ්ඩු ක්‍රමයක වාසි:.

*ඉක්මනින් හා පහසුවෙන් ආණ්ඩුවට තීරණ ගැනීමට හැකිවීම.

*මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩු වශයෙන් බලය ක්‍රියාවට නංවන ආයතන පද්ධති දෙකක් නොමැතිවීම නිසා ඒ දෙක අතර ඇතිවිය හැකියි ගැටුම් අවම වීම.
*පාලන ක්‍රමය මෙන්ම අධිකරණ ක්‍රමය ද සමස්ත රාජ්‍යයට ම පොදු එකක් වීම.

## බලය බෙදා හැරීම.

*බලය බෙදාහැරීම යනු මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක ,විධායක, සහ අධිකරණ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රාදේශීය ආණ්ඩු ඒකක වෙත පවරා දීම වේ.
*බලය බෙදා හැරීම සිදුකරන්නේ නම් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් විය යුතුය.
* අලුතින් බලය බෙදා හැරීමක් හෝ බෙදා හරින ලද බලතල සංශෝධනයට ලක් කරන්නේ නම් එවිට පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතුය.

## නූතන රාජ්‍යවල බලය බෙදා හැරීමට හේතු.

* විවිධත්වය තුළ එක්සත් කමක් ගොඩනගා ගැනීමේ අවශ්‍යතාව .
*රාජ්‍යය විශාලත්වය හේතුවෙන් එක් මධ්‍යස්ථානයක සිට පාලන කටයුතු සිදු කිරීමේ අපහසුතාව.
*ජාතික ආරක්ෂාව තහවුරු කර ගැනීම.

## සන්ධීය රාජ්‍ය

*සන්ධීය රාජ්‍ය යනු බලය බෙදා හැරීමක් සිදු කරන ලද රාජ්‍යය වේ.
නැතිනම්
*මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක විධායක සහ අධිකරණ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා ඇති රාජ්‍යයන් වේ.
*සන්ධීය රාජ්‍ය ක්‍රමයක මූලිකම ලක්ෂණය වන්නේ රාජ්‍යයේ යේ බලය මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර බෙදී තිබීමයි.
* සන්ධීය රාජ්‍ය; ෆෙඩරල් රාජ්‍යය ලෙසද හඳුන්වයි.

* ප්‍රාදේශීය ආණ්ඩු ප්‍රාන්ත ලෙස හඳුන්වයි.

## සන්ධීය රාජ්‍යයක ලක්ෂණ

*ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතීම.
*මධ්‍යම ආණ්ඩුවේ මෙන්ම ප්‍රාන්ත ආණ්ඩු සතු බලතල පැහැදිලිව ව්‍යවස්ථාව තුළ අන්තර්ගත කිරීම. *ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලය ඉහළ අධිකරණයට පැවරීම .
උදා; ඇමරිකා එක්සත් ජනපදයේ සන්ධීය අධිකරණය
*ඉහළ මන්ත්‍රණ සභාවක් ඇති කිරීම
උදා ; ඇමරිකා එක්සත් ජනපදයේ සෙනෙට් සභාව

## සන්ධීය රාජ්‍යයක සාර්ථක පැවැත්ම සඳහා තිබිය යුතු ගුණාංග

* රාජ්‍ය පවතින ආණ්ඩුකම ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරීම.
*සියලු ජන කොටස් පොදු හැඟීමෙන් යුතුව කටයුතු කිරීම .
*මූල්‍ය මේ සම්පත් බෙදාහැරීමේ දී ඒවා සාධාරණ ලෙස ප්‍රාන්ත ආණ්ඩු වෙත ලබා දීම.

## සන්ධීය රාජ්‍යයන් හි නව ප්‍රවනතා. *

*සන්ධිය රාජ්‍ය ක්‍රමයක් තුළ මධ්‍යම ආණ්ඩුව මෙන්ම ප්‍රාන්ත ආණ්ඩු එක හා සමානව සලකනු ලැබුවත් ක්‍රියාත්මක වීමේ දී දැකිය හැක්කේ මධ්‍යම ආණ්ඩුව ශක්තිමත් වීමේ ප්‍රවණතාවකි.

*මධ්‍යම ආණ්ඩුව එසේ ශක්තිමත් වීමට බලපෑ ඇති සාධක කීපයකි .

*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා පමණක් ප්‍රාන්ත ආණ්ඩු වල කැමැත්ත ලබා ගත්තද සාමාන්‍ය නීති සම්පාදන කාර්යන්හිදී ප්‍රාන්ත වල කැමැත්ත නොසලකා හැරීම.

* ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කරන අවස්ථාවලදී මධ්‍යම ආණ්ඩුවට වාසි සහගත වන ලෙස එය සිදු කිරීම.

*මධ්‍යයම ආණ්ඩුව හා ප්‍රාන්ත මූල්‍ය ගනුදෙනු පවත්වාගෙන යාමේදී වඩාත් ශක්තිමත් වී ඇත්තේ මධ්‍යම ආණ්ඩුව වීම.

* රාජ්‍යය විසින් සපයන සුබසාධන කාර්ය ඉහළ යාම තුළින් එහි වගකීම මධ්‍යම ආණ්ඩුවට පැවරීම.

## සන්ධිය ආණ්ඩු

*සන්ධීය රාජ්‍ය තුළ ක්‍රියාත්මක වන ආණ්ඩු ක්‍රම සන්ධිය ආණ්ඩු හෙවත් ෆෙඩරල් ආණ්ඩු ලෙස හඳුන්වයි.

* සන්ධීය ආණ්ඩුක්‍රමයක ප්‍රධානම ලක්ෂණය රාජ්‍ය බලාධිකාරිය මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩුව අතර බෙදී තිබීමයි.

-ඒ .වී .ඩයිසි-.

"විවිධත්වය තුළින් ඒකීයත්වය ළඟා කරගැනීමට මඟ සාදන ආණ්ඩු ක්‍රමය වේ."

-මහාචාර්ය කේ. සී. වියරෙ-.

"තමන්ගේ බල ක්ෂේත්‍රය තුළ ස්වාධීනව ක්‍රියාත්මක වීමට හැකියාව ඇති නමුත් සමහර කරුණු සම්බන්ධයෙන් එක්සත් ව ක්‍රියාත්මක වීමටත් මගපාදන උපාය මාර්ග සහිත තත්ත්වයකි."

## සන්ධීය ආණ්ඩුක්‍රම පවතින රටවල් ;

*ඇමරිකා එක්සත් ජනපදය *ස්විස්ටර්ලන්තය *ඕස්ට්‍රේලියාව

## සන්ධීය ආණ්ඩු ක්‍රමයක යහපත් ලක්ෂණ

*විවිධත්වයක් පවතින ජන සමාජයක් තුළ විවිධත්වයට ගරු කිරීම මගින් පොදු වූ ජාතිකත්වයක් ගොඩනගාගැනීම.

*භූමි ප්‍රමාණය විශාල රාජ්‍ය වල පරිපාලන තීන්දු ගැනීමට පහසු වීම.

*ප්‍රාන්ත ආණ්ඩු විසින් මධ්‍යම ආණ්ඩුවට සිදුකරන බලපෑම් හා මැදිහත්වීම් හේතුවෙන් රාජ්‍යයක් අත්තනෝමතිකව ක්‍රියා කිරීම වැළැක්වීමේ පහසුව.

*ප්‍රජාතන්ත්‍රවාදී පාලන රාමුව ශක්තිමත් වීම.

## සන්ධිය ආණ්ඩු ක්‍රමයක අයහපත් ලක්ෂණ:

* බලතල බෙදා දීම තුළ ප්‍රාන්ත ආණ්ඩුවලට ලැබී තිබෙන බලතල වලින් ඔවුන් සමහරවිට තෘප්තිමත් නොවීම.

*මධ්‍යයම ආණ්ඩුව වෙතින් ප්‍රාන්ත වෙන්න යාමට උත්සාහ ගැනීම පිළිබඳව ඇතිවී තිබෙන ප්‍රවණතාව.

*මධ්‍යයම සහ ප්‍රන්ත ආන්ඩු අතර ව්‍යවස්ථාව සමඟ තීන්දු ගැනීම තුළ යම් යම් ක්ෂේත්‍ර වලට අදාලව ගැටලුකාරී තත්ත්වයක් මතුවීම හා එමගින් පරිපාලනය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම.

*දෙවන මන්ත්‍රණ සභාවක් පැවතීම නිසා ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද වීම.

# ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීමේ ඉතිහාසය

*ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීම ආරම්භ වන්නේ රජ කල සිට ය.

*අනුරාධපුර යුගය තුළ පණ්ඩුකාභය රජු විසින් ගම් පාලනය කිරීම සඳහා ගම්බාර ගාමිණී වැනි නිලධාරීන් පත් කිරීම *

*පොළොන්නරු යුගය තුළ මහා පරාක්‍රමබාහු රජු විසින් ප්‍රාදේශීය පාලකයන් පත් කිරීම හා ඔවුන්ට පාලන බලතල ලබාදීම

*බටහිර ජාතීන් සංක්‍රමණය වීමත් සමගම ඔවුන් ද දේශපාලන නිලධාරීන් පත් කරන ලදී .
නිදසුන් ලෙස 1815 දී බ්‍රිතාන්‍යයන් විසින් පළාත් මට්ටමින් රෙසිඩන්ට් වරයකු පත්කිරීම.

## බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කර තිබූ ආකාරය.

* 1865 දී මහ නගර සභා ආඥා පනත සම්මත කිරීම.
*1865 දී කොළඹ සහ 1866 දී මහනුවර යන ප්‍රධාන මහා නගර සභා ස්ථාපිත විය
*1871දී ගම්සභා ක්‍රමය නැවත ස්ථාපිත කිරීම
*වර්ෂ 1931 දී ඩොනමෝර් ආණ්ඩුක්‍රම සංස්කරණය යටතේ පළාත් කටයුතු වෙනුවෙන් විධායක සභාවක් පිහිටුවීම
*1940 දී නගර සභා පිහිටුවීම
*1943 දී පළාත් පාලන ආඥා පනත සම්මත කිරීම

## නිදහසින් පසු යුගය තුළ බලය විමධ්‍යගත කිරීමට ගත් උත්සාහයන් :

* 1948 නිදහස ලබා ගැනීමෙන් පසුව ද පැවැති පළාත් පාලන ආයතන ක්‍රමයම තවදුරටත් පවත්වාගෙන යාම
*1973 බලය විමධ්‍යගත කිරීම සඳහා දේශපාලන අධිකාරි ක්‍රමය ස්ථාපිත කිරීම
*1980 දී දිස්ත්‍රික් අමාත්‍ය ක්‍රමය හරහා දිස්ත්‍රික් සංවර්ධන සභා ක්‍රියාත්මක කිරීම ගම් හා සුළු නගර සභා අහෝසි කිරීම
*1981 ප්‍රාදේශීය මණ්ඩලය ග්‍රාමෝදය මණ්ඩල ක්‍රියාත්මක කිරීම
*1987 යෙදී අංක 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත ට අනුව ප්‍රාදේශීය සභා ඇති කිරීම

## ලංකාවේ බලය බෙදාහැරීම සඳහා ගෙන ඇති උත්සාහයන්

*වර්ෂ 1926 දී එස්. ඩබ්ලිව්. ආර් .ඩී. බණ්ඩාරනායක මහතා විසින් උඩරට ප්‍රදේශ සඳහා සන්ධීය රාජ්‍යයන් ලබාදීම පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීම .
*1957 දී එස්. ඩබ්ලිව්. ආර් .ඩී. බණ්ඩාරනායක මහතා හා ඇස්.ජේ.වී. චෙල්වනායගම් මහතා අතර ඇතිවූ බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුම
*1965 ඩඩ්ලි -චෙල්වනායගම් ගිවිසුම

## පළාත් සභා පිහිටුවීම

*1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන ව්‍යවස්ථා සංශෝධනය හා 1987 අංක 42 දරණ පාර්ලිමේන්තු පනත මගින් ඒ වන විට පැවති පළාත් නමය පදනම් කරගෙන ශ්‍රී ලංකාවේ සභා ක්‍රමය ඇති කරන ලදී ඒ බව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 පරිච්ඡේදයෙන් 154 අවස්ථාවෙන් සමහන් වෙයි.

## පළාත් සභාවක ආයතනික ව්‍යුහය.

*පළාත් සභාව ආයතනික ව්‍යුහය ආණ්ඩුකාරවරයා ,මහ ඇමැතිවරයා ,අමාත්‍ය මණ්ඩලය ,පළාත් සභාව පළාත් සභා මන්ත්‍රි මණ්ඩලය යන ප්‍රධාන ඒකක වලින් සකස් වී ඇත.

## පළාත් ආණ්ඩුකාරවරයා

*සෑම පළාතකටම ආණ්ඩුකාරවරයෙකු සිටී
*මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභා අතර සම්බන්ධීකරණය සිදු කරන නියෝජිතයා ඔහුය
.*පළාත් ආණ්ඩුකාරවරයා පත් කරනුයේ ජනාධිපතිවරයා විසිනි
*නිල කාලය වසර 5 කි.
*නිල කාලය අවසන් වීමට පෙර ධූරයෙන් ඉල්ලා අස් විය හැක.
*පළාත් සභා මන්ත්‍රීවරුන් තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් සම්මත කරනු ලබන යෝජනාවකින් සිය ධූරයෙන් ඉවත් විය හැක.

## ආණ්ඩුකාරවරයා සතු බලතල හා කාර්යයන්

*පළාත් සභාව කැඳවීම, වාර අවසාන කිරීම හා විසුරුවා හැරීම,
*පළාත් සභාව ඇමතීම හා සන්දේශ යැවීම
* පළාත් සභා ප්‍රධාන අමාත්‍යවරයා පත්කිරීම අමාත්‍ය මණ්ඩලය හා අනෙක් පළාත් විධායක නිලධාරීන් පත් කිරීම
*පළාත් සභා ප්‍රඥප්තීන් අනුමත කිරීම
*මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභා අතර සම්බන්ධීකරණය සිදු කිරීම

## මහ ඇමැති සහ අමාත්‍ය මණ්ඩලය

*සෑම පළාත් සභාවකටම ප්‍රධාන ඇමතිවරයෙකු මෙන්ම අමාත්‍යවරු සිව් දෙනෙකුට නොවැඩි පිරිසකගෙන් සමන්විත විය .
*ආණ්ඩුකාරවරයා පළාත් සභාවේ මන්ත්‍රීවරුන් බහුතරයකගේ සහාය ලැබෙන තැනැත්තා ප්‍රධාන ඇමැතිවරයාගේ පත් කරයි
*ප්‍රධාන අමාත්‍යවරයා මෙන්ම අනික් අමාත්‍යවරුන් සිය කටයුතු සම්බන්ධයෙන් පළාත් සභාවට සාමූහිකව වග කීමට බැඳී සිටී.

## මහ ඇමැති සහ අමාත්‍ය මණ්ඩලය සතු බලතල හා කාර්යය

*පළාත් ආණ්ඩුකාර වරයාට උපදෙස් ලබාදීම.
*පළාතේ.  අයවැය ලේඛනය සකස් කිරීම ළාතේ ආර්ථික සංවර්ධන හා පරිපාලන සැකසුම් සකස් කිරීම ක්‍රියාත්මක කිරීම.

## පළාත් සභාව

*පළාත් සභාවක නිල කාලය වසර 5 කි.
* නියමිත නිල කාලය ඉක්ම යාමට පෙර විසුරුවා නොහැරිය හොත් පස් අවුරුදු නිල කාලය ඉක්ම යාමත් සමග අදාළ පළාත් සභාව විසි රැකියා සිය සලකයි.
*පළාත් සභාව සියලු මන්ත්‍රීවරුන් මහජන ඡන්දයෙන් පමණක් තෝරා පත් කර ගනී.

## පළාත් සභා සතු බලතල හා කාර්යන්

*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව ලැයිස්තු තුනක් පදනම් කරගෙන බලතල වර්ග කරයි .
*පළවෙනි ලැයිස්තුව -පළාත් සභා ලැයිස්තුව
*දෙවන ලැයිස්තුව -සංවෘත ලැයිස්තුව
*-තුන්වන ලැයිස්තුව -සමගාමී ලැයිස්තුව

## Ì ලැයිස්තුව– පළාත් සභා ලැයිස්තුව

*මෙහිදී පළාත් සභා වලට හිමිවන බලතල හා කාර්යයන් සඳහන් වේ .
*එහිදී බලතල හා කාර්යයන් තිස් හතක් දක්වා ඇත .
*පලාත් වලට අදාල ආර්ථික සැලසුම් ක්‍රියාත්මක කිරීම
*පළාත් පාලන කටයුතු
*පළාත නිවාස සංවර්ධන වැඩසටහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
*සමාජ සේවා හා පුනරුත්ථාපන කාර්යය සිදු කිරීම
*පළාත්බද කාර්යය සඳහා කෘෂිකාර්මික ව්‍යාප්තිය සුළු වාරිමාර්ග වැඩකටයුතු පුනරුත්ථාපනය හා නඩත්තුව

## සංවෘත ලැයිස්තුව

*මෙහි මධ්‍යම ආණ්ඩුව සතු බලතල දක්වා ඇත විෂය කරුණු 17කි
* සියලු විෂයයන් සහ කර්තව්‍ය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය
*විදේශ කටයුතු
*ජාතික ආදායමට මූල්‍ය ප්‍රතිපත්තියට හා විදේශ සම්පත් වලට අදාල මුදල් පිළිබඳ කටයුතු
*ජනලේඛන හා සංඛ්‍යාලේඛන ආගමනය හා විගමනය හා පුරවැසිභාවය

## සමගාමී ලැයිස්තුව

*මෙහිදී මධ්‍යම ආණ්ඩුවට හා පළාත් සභා යන  ආයතන දෙකටම අයිති බලතල සඳහන් වේ
*බලතල වර්ග 36ඇත.
*සැලසුම් කිරීම
*ජාතික නිවාස ඉදිකිරීම
*සමාජ සේවා සහ පුනරුත්ථාපන
*කෘෂිකර්මය හා ගොවිජන සේවා

## පළාත් පාලන ආයතන

* මධ්‍යම ආණ්ඩුවේ පරිපාලන කටයුතු පහසු කර ගැනීම සඳහා පළාත් පාලන ආයතන පද්ධතිය ස්ථාපිත කර ඇත
*මහ නගර සභාව – නගරාධිපති / උප නගරාධිපති
*නගර සභාව – සභාපති / උප සභාපති
*ප්‍රාදේශීය සභාව – සභාපති / උප සභාපති

## නගරාධිපති /සභාපති සතු බලතල හා කාර්ය.

*නගර සභාවේ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස ක්‍රියා කිරීම
*සභාව කැඳවීම මුලසුන ගැනීම හා සභාව කල් තැබීම
*අයවැය ලේඛනය හා සැලසුම් සකස් කිරීම
*මහජන උපයෝගීතා සේවා සැපයීම

## උප නගරාධිපති/ උප සභාපති සතු බලතල හා කාර්යන්

* මහ නගර සභාවේ නගරාධිපති ට නගර සභාවේ ප්‍රාදේශීය සභාවේ සභාපති විට අවශ්‍ය සහාය ලබාදීම
*නගරාධිපති සභාපති නොමැති අවස්ථාවල සභාවේ කටයුතු පවත්වාගෙන යාම

# ඇමරිකා එක්සත් ජනපදය

*සන්ධීය රාජ්‍යයකි.
*ජනපද 13 කින් ඇරඹි මේ රාජ්‍ය වර්තමානය ප්‍රාන්ත 50 කි
*බ්‍රිතාන්‍ය යටත් විජිතයක් පැවතීම හේතු කොට මුහුණ දුන් කටුක අත්දැකීම් නැවත ඇති නොවීමට ශක්තිමත් රාජ්‍යයක් ගොඩනගා ගැනීමේ අවශ්‍යතාව මත සන්ධීය රාජ්‍යයක් බවට පත්කර ඇත.

## ඇමරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම  ව්‍යුහය

*විධායක ජනාධිපති විසින් විධායක බලතල ක්‍රියාත්මක කිරීම
*ව්‍යවස්ථාදායකය ද්වි මාණ්ඩලික වීම නියෝජන මන්ත්‍රී මණ්ඩලය හා සෙනට් සභාව
*ව්‍යවස්ථාදායකය කොංග්‍රස් මණ්ඩලය නමින් හඳුන්වයි
*ජනාධිපතිවරයා විසින් සමහර බලතල ක්‍රියාවට නැංවීමේ දී සෙනෙට් සභාවේ අනුමැතිය ලබා ගත යුතු වීම
*මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර බලතල සම්බන්ධ ගැටලුවල දී ශ්‍රේෂ්ඨාධිකරණයට බලය හිමිවීම.

*සෙනෙට් සභාවේ නියෝජිතයින් 100කි.
*පෙඩරල් අධිකරණ පද්ධතියක් ක්‍රියාත්මක වේ
*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කිරීමට මධ්‍යම ආණ්ඩුවේ 2/3බලයක් ද ප්‍රාන්ත ආණ්ඩුව 3/4බලයක් ද අවශ්‍ය වේ
වර්තමානයේ ඇති සහ ඇමරිකා එක්සත් ජනපදය තුල ප්‍රාන්ත ආණ්ඩු ඉක්මවා යමින් මධ්‍යම ආණ්ඩුව ශක්තිමත් වීමේ ප්‍රවණතාවක් දක්නට වෙයි .
එයට හේතු

+සමාජ දේශපාලන ආර්ථික ගැටලුව සංකීර්ණ ස්වභාවය
+දෙවන ලෝක යුද්ධයෙන් පසු කාලය තුළ අන්තර්ජාතික ක්ෂේත්‍රය තුළ ඇතිවන බල අරගලය
+මූල්‍යමය වශයෙන් මානව ශක්තිමත් වීම

## ස්විස්ටර්ලන්තය.

* *සන්ධිය රාජය්යකි.
*සන්ධිය රාජ්‍යයක් බිහි කර ගැනීමට හේතු නම්

*ප්‍රංශය, ඉතාලිය ජර්මනිය සහ ඔස්ට්‍රේලියාව යන රටවල් හතරට මැදිව තිබීම හේතුකොට ජාතික ආරක්ෂාවට තර්ජනයක් එල්ල වීම
*දැඩි භූගෝලීය විෂමතා හේතුවෙන් ආර්ථික සංවර්ධනය ළඟා කර ගැනීම අපහසු වීම
*වාර්ගික සහ ආගමික විවිධත්වයට සාර්ථක විසඳුම් ලබා ගැනීම;

*ස්විස්ටර්ලන්තය ප්‍රාන්ත රාජ්‍යය කැන්ටන් නමින් හඳුන්වයි.
* කැන්ටන් 26කි.
* ව්‍යවස්ථාදායකය සන්ධීය මහ මණ්ඩලය ලෙස හඳුන්වයි එය ආයතන දෙකකි ජාතික සභාව රාජ්‍ය සභාව.
* සාමාජිකයින් හත් දෙනකුගෙන් සමන්විත සාමූහික විධායකයකි.

## මධ්‍යම ආණ්ඩුව සතු බලතල

*විදේශකටයුතු
*යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම
*විදේශ රටවල් හා ගිවිසුම් වලට එළඹීම
*ආරක්ෂක හමුදා කටයුතු

## කැන්ටන් සතු බලතල

*අධ්‍යපනය උසස් අධ්‍යාපනය
*පුවත්පත් පාලනය
*මහාමාර්ග
*කර්මාන්ත හා ආගමන.

## ස්විස්ටර්ලන්ත සන්ධිය ක්‍රමයේ සුවිශේෂ ලක්ෂණ

*මධ්‍යම ආණ්ඩුව හා කැන්ටන් සතු බලතල දක්වා ඇති අතර ඉතුරු සියලු බලතල මධ්‍යම ආණ්ඩුවට හිමිවීම
*බලතල ක්‍රියාවට නැංවීමේදී ගැටලුකාරී තත්ත්වයක් ඇතිවුවහොත් එය විසඳීම බලය සන්ධියේ මහා මණ්ඩලය සතු වීම
*කැන්ටන් වලට තම බලය ක්‍රියාවට නංවමින් ස්වාධීනව කටයුතු කිරීමේ අවස්ථාව අහිමි වීම

1.ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ක්‍රමයට බලය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

2. පරමාධිපත්‍ය බලය යනු කුමක්ද?

3. බලයෙ විවිධ ස්වරූප නම් කරන්න

4. දේශපාලන විද්‍යාත්මක දෘෂ්ටිකෝණයට අනුව බල යන්න හඳුන්වන්න

5.ආර්ථික විද්‍යාත්මක දෘෂ්ටිකෝණයට අනුව බලය යනු කුමක්ද ?

6.සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයට අනුව බලය යන හඳුන්වන්න.

7බලය විමධ්‍යගත කිරීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

බලය විමධ්‍යගත කිරීමේ විශේෂ ලක්ෂණය කුමක්ද? ඒ සඳහා නිදසුනක් ලබාදෙන්න.

8. ශ්‍රී ලංකාවේ පරිපාලන රටාව විමධ්‍යකර ඇති ආකාරය පහදන්න .

9. ඒකීය රාජ්‍යය යනු කුමක්ද ?

10. මහාචාර්ය හර්මන් ජෙ. ෆයිනර් එකීය රාජ්‍ය හඳුන්වා දී ඇති ආකාරය ලියන්න.

11. මහාචාර්ය සී එෆ් ස්ටොන්ග් එකීය රාජ්‍ය හඳුන්වා ඇති ආකාරය ලියන්න .

12. ඒකීය රාජ්‍යයක ඒකෙ ආණ්ඩුක්‍රමයක ලක්ෂණ තුනක් ලියන්න.

13.ඒකීය ආණ්ඩු ක්‍රමයක වාසි තුනක් ලියන්න.

14.බලය බෙදා හැරීම යනු කුමක්ද?

15.නූතන රාජ්‍යය වල බලය බෙදා හැරීමට හේතු තුනක් ලියන්න.

16. සන්ධීය රාජ්‍ය යන්න හඳුන්වන්න.

17.සන්ධීය රාජ්‍යයක ලක්ෂණ තුනක් ලියන්න.

18. සන්ධීය රාජ්‍යයක සාර්ථක පැවැත්ම සහාවක් තිබිය යුතු ගුණාංග තුනක් ලියන්න.

19.සන්ධීය රාජ්‍යයන් හි නව ප්‍රවනතා මොනවාද?

20. එම ප්‍රවණතාව ඇතිවීමට බලපා ඇති හේතු දෙකක් සඳහන් කරන්න.

21. සන්ධීය ආණ්ඩුව යන්න හඳුන්වන්න.

22.ඒ වී ඩයිසි සන්ධීය ආණ්ඩුක්‍රමය නිර්වචනය කර ඇති ආකාරය ලියන්න

.23.මහාචාර්ය කේ සී වියරෙ සන්ධීය ආණ්ඩුක්‍රමය නිර්වචනය කර ඇති ආකාරය ලියන්න

24. සන්ධිය ආණ්ඩු ක්‍රම පවතින රටවල් මොනවාද ?

25.සන්ධිය ආණ්ඩු ක්‍රමයට යහපත් ලක්ෂණ තුනක් ලියන්න.

26. සන්ධීය ආණ්ඩු ක්‍රමයක අයහපත් ලක්ෂණ තුනක් ලියන්න.

27.ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීමේ ඉතිහාසය කෙටියෙන් විස්තර කරන්න.

28.ශ්‍රී ලංකාවේ බලය බෙදාහැරීම සඳහා ගෙන ඇති උත්සාහයන් මොනවාද?

29. ශ්‍රී ලංකාවේ පලාත් සභා පිහිටුවීම සම්බන්ධ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා පාර්ලිමේන්තු පනත නම් කරන්න.

30. පළාත් සභාවක ආයතනික ව්‍යුහය සකස් වී තිබෙන අයුරු දක්වන්න .

31.පළාත් සභාවක ආන්ඩුකාරවරයා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න

. 32.ආණ්ඩුකාරවරයා ධුරයෙන් ඉවත් විය හැකි අවස්ථා දෙක නම් කරන්න.

33.ආණ්ඩුකාරවරයා සතු බලතල හා කාර්ය හතරක් ලියන්න.

34. මහ ඇමතිවරයා සහ අමාත්‍ය මණ්ඩලය පත් කරනුයේ කෙසේද?

35.පළාත් සභාවක සිටිය යුතු ඇමතිවරු ප්‍රමාණය කෙතෙක්ද?

36. මහ ඇමැති සහ අමාත්‍ය මණ්ඩලය සතු බලතල හා කාර්යයන් දෙකක් ලියන්න.

37. පළාත් සභාව පිහිටුවන ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කුමක්ද ?

38.පළාත් සභාවක නිල කාලය කොපමණද?

39. පළාත් සභා සතු බලතල වර්ග කර ඇති ලැයිස්තු තුන නම් කරන්න.

40.පළවෙනි ලැයිස්තුවෙහි සඳහන් කාර්යයන් කොපමණ ද?

41. ඒවායින් හතරක් ලියන්න.

42. දෙවන ලැයිස්තුවෙහි විෂය කරුණු කොපමණද?

43. දෙවන ලැයිස්තුවෙහි විෂය කරුණු සම්බන්ධව ඇති බලතල හතරක් ලියන්න.

44. තුන්වෙනි ලැයිස්තුවෙහි සඳහන් වන්නේ කුමන ආයතන වලට අයත් බලතල ද?

45.එහි බලතල ප්‍රමාණය කොපමණද?

46. තුන්වන ලැයිස්තුවට අයත් බලතල හතරක් නම් කරන්න.

47.ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන මොනවාද ?

48.එම  පළාත් පාලන ආයතන වල විධායක නිලධාරීන් නම් කරන්න.

49.නගරාධිපති /සභාපති සතු බලතල හා කාර්යයන් පහක් නම් කරන්න.

50. උප නගරාධිපති /උප සභාපති සතු බලතල හා කාර්යයන් දෙකක් නම් කරන්න.

51. ඇමරිකා එක්සත් ජනපදයේ ඇරඹුනු ජනපද කීයද?

52.වර්තමානයේ පවතින ජනපද කොපමනද?

53.ඇමරිකා එක්සත් ජනපදය සන්ධීය රාජ්‍යයන් ලෙස සකස් වීමට හේතු කුමක්ද?

54. ඇමරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යුහය සකස් වී ඇති අයුරු කෙටියෙන් සඳහන් කරන්න.

55. ඇමරිකා එක්සත් ජනපදයේ ව්‍යවස්ථාදායකය හඳුන්වන නම කුමක්ද?

56. එහි පවතින ආයතන දෙක මොනවාද?

57.ඇමරිකා එක්සත් ජනපදයේ සෙන සභාවේ නියෝජිතයන් ගණන කීයද?

58.ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු ආකාරය කෙසේද?

59.වර්තමානයේ ඇමරිකා එක්සත් ජනපදය තුළ ප්‍රාන්ත ආණ්ඩු ඉක්මවා යමින් මධ්‍යම ආණ්ඩුව ශක්තිමත් වීමේ ප්‍රවණතාවය ට හේතු තුනක් දක්වන්න.

60.ස්විස්ටර්ලන්තය සන්ධීය රාජ්‍යයක් ලෙස බිහි වීමට බලපෑ හේතු මොනවාද

61. ස්විස්ටර්ලන්තයේ ප්‍රාන්ත ප්‍රමාණය කොපමණද?

62.එම ප්‍රාන්ත හඳුන්වන විශේෂිත වූ නාමය කුමක්ද?

,63.ස්විස්ටර්ලන්තයේ ව්‍යවස්ථාදායකය හඳුන්වන නම

64. මධ්‍යම ආණ්ඩුව සතු බලතල තුනක් නම් කරන්න. කුමක්ද?

65.කැන්ටන් සතු බලතල පහක් නම් කරන්න.

66. ස්විස්ටර්ලන්ත සන්ධීය ක්‍රමයේ සුවිශේෂ ලක්ෂණ තුනක් නම් කරන්න